**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 2023/2024**

**05 වන මට්ටම**

**LLU 5709 පරිපාලන නීතිය**

**අවසාන පරීක්ෂණය**

**කාලය පැය 03 යි.**

---

**දිනය : 2025 මැයි මස 23** **වේලාව: ප.ව. 1.30- ප.ව. 4.30**

---

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි .**

**ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

1. 2020 පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන පනත මගින් රට තුළ සූර්ය බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම සඳහා රීති නිකුත් කිරීමට බලශක්ති අමාත්‍යවරයාට බලය පවරයි. පනතේ 30 වන වගන්තිය මගින්, ගාස්තු නියම කිරීම සහ අනුකූලතාව සහතික කිරීම වැනි සීමිත නියාමන කාර්යයන් රාජ්‍ය විදුලි නියාමන මණ්ඩල (SERB) වෙත අනුනියෝජනය කිරීමේ බලය අමාත්‍යවරයාට ලබා දී ඇත. 2025 අප්‍රේල් 2 වන දින, අමාත්‍යවරයා 30 වන වගන්තිය යටතේ රීතියක් නිකුත් කරමින්, මහජන අවශ්‍යතා ඇති අවස්ථාවක දී අවශ්‍ය පරිදි සූර්ය බලශක්ති ඒකක සඳහා ගාස්තු වෙනස් කිරීමට සහ පුද්ගලික සූර්ය බලශක්ති සමාගම්වලට ලබාදෙන සහනාධාරය අත්හිටුවීමට SERB හට අවසර දුන්නේය. 35 වන වගන්තියට අනුව, නව අනුපාත පැනවීමට පෙර සූර්ය බලශක්ති නිෂ්පාදන සමාගම්වලට මාස දෙකක පූර්ව දැනුම්දීමක් සහ ඇහුම්කන් දීමක් ලබා දීමට SERB හට අවශ්‍ය වේ. පනතේ 40 වන වගන්තියේ මෙසේ සඳහන් වේ:
   'මෙම පනත යටතේ නියාමන මණ්ඩලය විසින් කරන ලද කිසිදු නියෝගයක් කිසිදු අධිකරණයකදී අභියෝගයට ලක් නොකළ යුතුය'.

   SERB විසින් 2025 අප්‍රේල් 10 වන දින වහාම ක්‍රියාත්මක වන පරිදි පහත තීරණ ගෙන ඇත.

   අ) අතිරික්ත සැපයුම සහ රාජ්‍යයට මූල්‍යමය බරක් පැනවීම යන පදනම මත සියලුම පෞද්ගලික සූර්ය බලශක්ති නිෂ්පාදකයින්ට වහාම ක්‍රියාත්මක වන පරිදි විදුලිය ඒකකයක මිලදී ගැනීමේ මිල රු. 35/= සිට රු. 12/= දක්වා අඩු කරමින් නියෝගයක් නිකුත් කරන ලදී.

   ආ) ඉහත (අ) හි සඳහන් කර ඇති පදනම මතම ප්‍රධාන සූර්ය බලශක්ති සමාගම් පහක් සමඟ දැනටමත් පවතින සූර්ය බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් අවලංගු කරන ලදී.

   Eco Energy පුද්ගලික සමාගම යනු SERB සමඟ වසර 10 ක ස්ථාවර අනුපාත ගිවිසුමකට එළඹුණු ප්‍රධාන සමාගම් පහෙන් එකකි. එකී සමාගම SERB හි තීරණ අභියෝගයට ලක් කිරීමට අපේක්ෂා කරයි.

   Eco Energy පුද්ගලික සමාගම වෙත උපදෙස් ලබා දෙන්න.

   නඩු තීන්දු ඇසුරින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න. **(ලකුණු 20)**

2. ග්‍රීන් පාර්ක් මාවතේ ජීවත් වන පදිංචිකරුවන් පිරිසක් කියා සිටියේ සියෙරා නගර සභාව (CCC) ප්‍රදේශයේ පොදු ඉඩමක පිරවුම්හලක් ඉදිකිරීමෙන් තම ප්‍රදේශය අනාරක්ෂිත හා අපිරිසිදු කර ඇති බවයි. තවද, ඔවුන් දන්වා සිටින්නේ CCC විසින් එහි කසළ ට්‍රක් රථ, ට්‍රැක්ටර්, ජල ප්‍රවාහන යන්ත්‍ර සහ බැකෝ යන්ත්‍ර සඳහා වාහන නැවැත්වීමේ සහ සේවා භූමියක් ලෙස යාබද පොදු ඉඩම භාවිතා කිරීමට පටන් ගෙන ඇති බවයි. මෙම වාහන දිගු කාලයක් ප්‍රදේශයේ ස්ථානගත කර ඇති අතර, බොහෝ විට අපජලය කාන්දු වන අතර දරාගත නොහැකි දුර්ගන්ධයක් සහ ශබ්දයක් නිකුත් කරයි. ඉඩම නිසි ලෙස නඩත්තු කිරීම, වාහන වෙනත් ස්ථානයකට ගෙන යාම සහ සනීපාරක්ෂක පියවර ගන්නා ලෙස CCC වෙතින් ඉල්ලා පදිංචිකරුවන් නැවත නැවතත් ලිඛිත පැමිණිලි ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, අද වන විටත් පදිංචිකරුවන්ට කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. සියලු උත්සාහයන් අවසන් කිරීමෙන් පසු, පදිංචිකරුවන් නඩුවක් ගොනු කිරීමට සැලසුම් කරයි.

පහත සඳහන් කරුණු පිළිබඳව පදිංචිකරුවන්ට උපදෙස් ලබා දෙන්න.

අ) ඔවුන්ට ඇති සුදුසු ප්‍රතිකර්ම සහ එම ප්‍රතිකර්ම ලබා ගැනීම සඳහා අධිකරණය ඉදිරියේ ඔවුන් සපුරාලිය යුතු අවශ්‍යතා.

**(ලකුණු 12)**

ආ) ඔබ ඉහත සාකච්ඡා කළ ප්‍රතිකර්ම ලබා ගැනීමට යාමේදී පදිංචිකරුවන්ට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග සාකච්ඡා කරන්න.

**(ලකුණු 08)**

3. පරිසර කළමනාකරණ පනත මගින් හරිත නියාමන මණ්ඩලයට Green Regulatory Board (GRB) පාරිසරික ප්‍රමිතීන්ට අනුකූල වීම නිරීක්ෂණය කිරීමට සහ මිනිස් සෞඛ්‍යයට සහ පරිසරයට අහිතකර කර්මාන්තශාලා බලපත්‍ර අවලංගු කිරීමට බලය පවරයි. පනතේ 04 වන වගන්තියට අනුව, එවැනි අවලංගු කිරීමකට පෙර සති දෙකකට නොඅඩු කාලයක් සඳහා මහජන විමර්ශනයක් සහ හේතු දැක්වීමේ දැන්වීමක් අවශ්‍ය වේ. පනතේ 10 වන වගන්තියට අනුව, විනිශ්චය කිරීම සහ මුදල් වන්දි පැනවීම සඳහා ජාතික හරිත විනිශ්චය සභා පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත විනිශ්චය සභා වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමට මණ්ඩලයට බලය ඇත.

GRB මෑතකදී මහා පරිමාණ බැටරි නිෂ්පාදන සමාගමක් වන OIS සමාගමේ බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කළේය. GRB විසින් නිකුත් කරන ලද පූර්ව නිවේදනවලට අනුකූල නොවී යාබද වැවට සමාගම විසින් අවදානම් සහගත අපද්‍රව්‍ය මුදා හරින බව GRB කියා සිටියේය. ඊට අමතරව, බලපෑමට ලක් වූ ගම්වැසියන්ට රුපියල් මිලියන දහයක් ගෙවන ලෙස GRB විසින් OIS සමාගමට නියෝග කරන ලදී.

(අ) ඉහත සිද්ධියේ නීතිමය ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න. **(ලකුණු 12)**

(ආ) සුදුසු නීතිමය ප්‍රතිකර්ම පිළිබඳව OIS සමාගමට උපදෙස් දෙන්න. **(ලකුණු 08)**

4. රජයේ වෛද්‍ය නිලධාරියෙකු වන වෛද්‍ය පෙරෝ, වෛද්‍ය නොසැලකිලිමත්කමක් සිදු කළ බවට චෝදනා කරමින් රසිනෝ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සේවයෙන් පහ කරන ලදී. ඔහු QS නම් පෞද්ගලික රෝහලක ප්‍රධාන උපදේශකයා වේ. ඔහුව විමර්ශනයක් සඳහා කැඳවනු ලැබූ අතර, වෛද්‍ය ටැබු විමර්ශන මණ්ඩලයේ සභාපතිවරයා බව ඔහු දුටුවේය. QS පෞද්ගලික රෝහලේ සෘජු තරඟකරුවෙකු වන බීටා පෞද්ගලික රෝහලේ හිමිකරු වෛද්‍ය ටැබු ය. විමර්ශන කමිටුව අභ්‍යන්තර වාර්තාවක් මත විශ්වාසය තැබූ අතර, වාර්තාවේ පිටපතක් හෝ සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් වෛද්‍ය පෙරෝට ලබා දුන්නේ නැති අතර

නීතිමය නියෝජනයට අවසර නොලැබුණු අතර, සේවයෙන් පහ කිරීම සඳහා කිසිදු හේතුවක් ද දක්වා නොමැත.

(අ) ඉහත අවස්ථාවේ දී ස්වභාවික යුක්ති මූලධර්ම උල්ලංඝනය වී ඇත්දැයි පරීක්ෂා කරන්න. නඩු තීන්දු මගින් ඔබේ පිළිතුර තහවුරු කරන්න. **(ලකුණු 10)**

(ආ) වෛද්‍ය පෙරෝට ලබා ගත හැකි නීතිමය ප්‍රතිකර්ම මොනවාද? අදාළ නඩු තීන්දු ඇසුරෙන් සාකච්ඡා කරන්න. **(ලකුණු 04)**

( ඇ ) 'යුක්තිය ඉටු කිරීමට පමණක් නොව, නඩු පවරන මහජනතාවට එය ඉටු වන බව පෙනෙන්නට ද තිබිය යුතුය.' මෙම ප්‍රකාශය ඇසුරින්, මෙම මූලධර්මය පක්ෂග්‍රාහීත්වයට එරෙහි රීතියෙහි පරීක්ෂණයන්ට සහාය වන ආකාරය සාකච්ඡා කරන්න. **(ලකුණු 06)**

5. බාලි හි වෙරළ සංරක්ෂණ හා මත්ස්‍ය නිෂ්පාදන සංවර්ධන අමාත්‍යවරයා පහත සඳහන් නියෝග නිකුත් කරයි.

(අ) ගැඹුරු මුහුදේ සියලුම ඩීසල් බලයෙන් ක්‍රියාත්මක වන බෝට්ටු භාවිතය වහාම ක්‍රියාත්මක වන පරිදි තහනම් කිරීම. අදාළ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර සහ යෝජිත වෙනස්කම් පිළිබඳව දින 30 ක පූර්ව දැනුම් දීමකින් පසුව පමණක් විමෝචන ප්‍රමිතීන් (emission standards) "නියාමනය" කිරීමට පනත මඟින් අමාත්‍යවරයාට බලය පවරනු ලැබේ.

(ආ) කිසිදු දැනුම්දීමකින් තොරව, සෞඛ්‍ය රීතීන් උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා එල්ල වන මුහුදු ආහාර නිෂ්පාදන සමාගමක බලපත්‍රය අවලංගු කිරීම. පනතේ දැක්වෙන්නේ බලපත්‍රය අවලංගු කිරීමට පෙර අමාත්‍යවරයා විසින් හේතු දැක්වීමේ දැන්වීමක් නිකුත් කර ප්‍රතිචාර දැක්වීම සඳහා සති දෙකක කාලයක් ලබා දිය යුතු බවයි.

පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් ඉහත නියෝග අධිකරණ සමාලෝචනයෙන් නිදහස් කළ හැකිද යන්න සාකච්ඡා කරන්න.

i. පනතේ 25 වන වගන්තියේ සඳහන් වන්නේ "මෙම පනත යටතේ අමාත්‍යවරයා විසින් ගන්නා ලද ඕනෑම තීරණයක් ප්‍රශ්න කිරීමට කිසිදු අධිකරණයකට අධිකරණ බලයක් නොමැති" බවයි.

ii. බාලි රාජ්‍යයේ නීතිමය විධිවිධාන ශ්‍රී ලංකාවේ 1974 අංක 29 දරන අර්ථනිරූපන (සංශෝධන) නීතියට සමාන වේ.

**(ලකුණු 20)**

6. රොමේෂ් කටුනායක ගුවන්තොටුපළේ සේවය කරන නිලධාරියෙකි. ඔහු 2025 මාර්තු 15 වන දින රාජකාරියේ යෙදී සිටියදී රන් කාසි ජාවාරම් කිරීමට උත්සාහ කළ බවට සැක කෙරෙන මගියෙකු පරීක්ෂා කිරීම ආරම්භ කළේය. තවත් නිලධාරීන් කිහිප දෙනෙකුගේ සහාය ඇතිව, සැකකරු අත්අඩංගුවට ගත් අතර, රන් කාසි රාජසන්තක කරන ලදී. සිද්ධියෙන් සතියකට පසු, රොමේෂ් රේගු දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 400 යටතේ ත්‍යාගයක් ඉල්ලා සිටියේය. හඳුනාගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රධාන ආරම්භක නිලධාරියාට එවැනි හඳුනාගැනීම් සඳහා ත්‍යාග ඉල්ලා සිටීමට අයිතියක් ඇති බව එහි සඳහන් වේ. පනතට අනුව, 'ප්‍රධාන ආරම්භක නිලධාරියා' යන්නෙහි තේරුම "රේගු රෙගුලාසි උල්ලංඝනයක් හඳුනා ගැනීමට හෝ විමර්ශනයක් ආරම්භ කිරීමට අදාළ රේගු ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියා" යන්නයි. චක්‍රලේඛයේ තවදුරටත් සඳහන් වන්නේ, යම්කිසි ගැටුම් සහගත අවස්ථාවකදී , රේගු කොමසාරිස් ජනරාල්වරයා විසින් රේගු මණ්ඩලය සමඟ සාකච්ඡා කර එම ගැටළු විසඳා ගත යුතු බවයි."

එම සිද්ධියට සම්බන්ධ තවත් නිලධාරියෙකු වන කනිෂ්ක ද ත්‍යාගය ඉල්ලා සිටියේ චක්‍රලේඛයට අනුව සැබෑ ආරම්භක නිලධාරියා රොමේෂ් නොව තමා බව පවසමිනි. කනිෂ්ක ද ආරම්භක

නිලධාරියෙකු ලෙස සලකනු ලැබිය හැකි බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කර ත්‍යාගය ප්‍රදානය කළේය. රොමේෂ් නඩුවක් ගොනු කර එම තීරණයට අභියෝග කරමින්, එය අතාර්කික, අත්තනෝමතික සහ අසාධාරණ බවට තර්ක කළේය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය ඔහුගේ පරම අභිමතය පරිදි ක්‍රියාත්මක කිරීමක් බවත් කිසිදු අධිකරණයකදී ප්‍රශ්න කළ නොහැකි බවත් රේගු දෙපාර්තමේන්තුව තීරණය කළේය.

(අ) මෙම නඩුවේ මූලසුන හොබවන විනිසුරුවරයා ඔබ යැයි උපකල්පනය කරන්න. පරිපාලන නීතියේ මූලධර්ම මත පදනම්ව, රොමේෂ් සඳහා සුදුසු නෛතික ප්‍රතිකර්ම ඇතුළත් තීන්දුවක් ලියන්න.

**(ලකුණු 12)**

(ආ) "නීතියේ ආධිපත්‍යයට අනුව නීතිමය සීමාවන් තුළ අභිමතය ක්‍රියාත්මක කළ යුතුය." පරිපාලන නීතියේ අභිමතය අනිසි ලෙස භාවිතා කිරීම පාලනය කිරීම සම්බන්ධයෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

**(ලකුණු 08)**

7. " අභිනියෝජන ව්‍යවස්ථා", සංකීර්ණ හා විකාශනය වන නියාමන අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමේදී නම්‍යශීලීභාවය සහ කාර්යක්ෂමතාව ලබා දෙන අතර, වගවීම, ප්‍රජාතන්ත්‍රවාදී නීත්‍යානුකූලභාවය සහ බලය අනිසි ලෙස භාවිතා කිරීමේ විභවය පිළිබඳ ගැටළු ද මතු කරයි.... අධිකරණ පාලනයේ යාන්ත්‍රණයන් ස්ථාපිත කරන ලද්දේ ඒවායේ නීත්‍යානුකූලභාවය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදයේ මූලධර්මවලට අනුකූල වීම සහතික කිරීම සඳහා ය".

Shrivastava, Manas. "Introduction to Delegated Legislation and Its Judicial Control." Issue 2 Int'l JL Mgmt. & Human. 7 (2024): 3018.

(අ) ඉහත ප්‍රකාශය අනුව, අභිනියෝජන ව්‍යවස්ථාවන් ප්‍රජාතන්ත්‍රවාදී උත්සුකයන් සමඟ සම්බන්ධ වන ආකාරය සහ එය බලතල බෙදීමේ සිද්ධාන්තය අඩපණ කළ හැකි ආකාරය විවේචනාත්මකව අගය කරන්න.

(ආ) අභිනියෝජන ව්‍යවස්ථාවන්හි අධිකරණ පාලනය පිළිබඳ යාන්ත්‍රණය පැහැදිලි කරන්න.

**(ලකුණු 10x2=ලකුණු 20)**

8. පහත සඳහන් ඕනෑම දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) අධිකරණ බලය වක්‍රව සහ ඍජුව බැහැර කිරීම

(ආ) පරිපාලන නීතිය තුළ ප්‍රකාශන ආඥාවන්හි වාසි

(ඇ) සර්ටියෝරාරි රිට් ආඥාවේ විෂය පථය

(ඈ) වාර්තාව මතුපිට දෝෂය

**(ලකුණු 10x2=ලකුණු 20)**

*****සියළුම හිමිකම් ඇවිරිණි*****